20

අමාත්‍යාංශ චක්‍රලේඛ : 03/2021

මගේ අංකය: SMRIP/ES/01/06/අභ්‍යන්තර චක්‍රලේඛ
වේවැල්, පිත්තල, මැටි, ලී බඩු, සහ ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
07 වන මහල, බටහිර කුළුන,
ලෝක වෙළඳ මධ්‍යස්ථානය,
කොළඹ 01.

2021.02.25

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්,

සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්,

සියළුම දිස්ත්‍රික් විද්‍යා නිලධාරීන්,

සියළුම මධ්‍යස්ථාන භාර විද්‍යා හා තාක්ෂණ නිලධාරීන්,

**එක් ග්‍රාම නිලධාරී වසමකට එක් ග්‍රාමීය කර්මාන්ත ව්‍යවසායකයෙක් බිහිකිරීමේ වැඩසටහන**

01. හැඳින්වීම

රජයේ ජාතික ප්‍රතිපත්ති රාමුව, රට හදන සෞභාග්‍යයේ දැක්මට හා තිරසර සංවර්ධන ප්‍රතිපත්තිවලට අනුව ජනතා කේන්ද්‍රීය ආර්ථිකයක් ලඟා කර ගැනීම වෙනුවෙන් ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම වේවැල්, පිත්තල, මැටි, ලී බඩු සහ ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ ප්‍රමුඛ කාර්යයක් වේ. ඒ අනුව 2021 වර්ෂය සඳහා එක් ග්‍රාම නිලධාරී කොට්ඨාශයකට අවම වශයෙන් එක් ව්‍යවසායකයකු බැගින් නව ග්‍රාමීය කර්මාන්ත ව්‍යවසායකයින් 14,000 ක් වර්ෂයක් තුළ බිහි කිරීම, මෙම වැඩසටහන මඟින් අරමුණු කෙරේ. මෙම සංවර්ධන වැඩසටහන සඳහා රු. මිලියන 800 ක ප්‍රතිපාදන වෙන් කිරීමට වේවැල්, පිත්තල, මැටි, ලී බඩු සහ ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය කටයුතු කර ඇත.

දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ අධීක්ෂණයෙන්, ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ මෙහෙයවීමෙන් අමාත්‍යාංශයේ විද්‍යා අංශය යටතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ක්‍රියාත්මක වන විද්‍යා සම්පත් මධ්‍යස්ථාන හරහා දිස්ත්‍රික් විද්‍යා නිලධාරීන්ගේ සම්බන්ධීකරණයෙන් මධ්‍යස්ථාන භාර විද්‍යා හා තාක්ෂණ නිලධාරීන්, ක්ෂේත්‍ර සම්බන්ධීකාරකවරුන් විසින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ප්‍රාදේශීය සංවර්ධනයට අදාල ආයතනවල හා පෞද්ගලික අංශයේ සහයෝගයෙන් මෙම වැඩසටහන ක්‍රියාත්මක කරනු ලැබේ.

මෙම වැඩසටහන රජයේ ග්‍රාමීය ආර්ථිකය නගා සිටුවීමේ ජාතික වැඩසටහන, ගෘහාශ්‍රිත කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන වැනි ජාතික වැඩසටහන් වල අරමුණු ඉටුවන පරිදි ඒකාබද්ධ වැඩසටහනක් ලෙස ක්‍රියාත්මක කරනු ලැබේ.

02. වැඩසටහනේ අරමුණු

- 2021 වර්ෂය තුළ ග්‍රාම නිලධාරී වසම් මට්ටමින් ග්‍රාමීය කර්මාන්ත ව්‍යවසායකයින් 14,000 කින් ඉහල නැංවීම.
- ග්‍රාමීය කර්මාන්ත ව්‍යවසායකයින්ගේ නව තාක්ෂණික භාවිතයන් ප්‍රවර්ධනය කිරීම.
- නව තාක්ෂණික යන්ත්‍ර උපකරණ භාවිතයන් ප්‍රවර්ධනය කිරීම.
- දේශීය අමුද්‍රව්‍ය භාවිතය සඳහා දිරිගැන්වීම.
- ප්‍රාථමික නිෂ්පාදනයන් අගය එකතු කළ නිෂ්පාදනයන් බවට පරිවර්තනය කිරීම.
- ආනයන ආදේශන නිෂ්පාදන ප්‍රචලිත කිරීම.
- නිෂ්පාදන භාණ්ඩවල ගුණාත්මක තත්වය ඉහල නැංවීම.
- ජාතික ආර්ථිකයට ක්ෂුද්‍ර / කුඩා පරිමාණ කර්මාන්තකරුවන්ගේ දායකත්වය ඉහල නැංවීම.

## 03. වැඩසටහන් කළමනාකරණය සඳහා මාර්ගෝපදේශ

### 3.1 ප්‍රතිලාභීන් තෝරා ගැනීම.

3.1.1 ප්‍රාදේශීය ලේකම්ගේ මූලිකත්වයෙන් ග්‍රාම නිලධාරි, ආර්ථික සංවර්ධන නිලධාරි, සමෘද්ධි සංවර්ධන නිලධාරි, කෘෂි පර්යේෂණ නිෂ්පාදන සහකාර හා අනෙකුත් ග්‍රාම නිලධාරි මට්ටමේ නිලධාරීන් දැනුවත් කර, ඔවුන් මගින් මෙම වැඩසටහන පිළිබඳ ග්‍රාමීය ප්‍රජාව හා ග්‍රාමීය සංවර්ධන කමිටුව දැනුවත් කිරීම.

3.1.2 ඇමුණුම - 01 හි සඳහන් ඉල්ලුම්පත්‍ර ග්‍රාම නිලධාරි කොට්ඨාශයේ කර්මාන්ත ආරම්භ කිරීමට කැමති ව්‍යවසායකයන්, ග්‍රාමීය කමිටුව මගින් ඉහත නිලධාරීන්ගේ නිර්දේශ සහිතව ප්‍රාදේශීය ලේකම් වෙත ඉදිරිපත් කල යුතුය.

3.1.3 ප්‍රාදේශීය ලේකම් විසින් නම් කරනු ලබන මාණ්ඩලික නිලධාරියකු, මධ්‍යස්ථාන භාර විද්‍යා හා තාක්ෂණ නිලධාරි හෝ ක්ෂේත්‍ර සම්බන්ධීකාරක හා ප්‍රාදේශීය ලේකම් විසින් නම් කරනු ලබන නිලධාරියකු ඇතුලත් ත්‍රිපුද්ගල මණ්ඩලය විසින් සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුසු ප්‍රතිලාභීන් තෝරා ගෙන ප්‍රාදේශීය සංවර්ධන කමිටුවේ / ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතිය ලබා ගත යුතුය. ප්‍රතිලාභීන් තෝරාගැනීම සඳහා නිර්ණායකයන් ඇමුණුම - 02 හි සඳහන් පරිදි භාවිතා කල යුතුය.

3.1.4 තෝරා ගත් ව්‍යවසායකයන් සඳහා ඇමුණුම - 03 අනුව ව්‍යාපෘති වාර්තාවක් අනෙකුත් ආයතනවල සහයෝගීත්වයෙන් විද්‍යා හා තාක්ෂණ නිලධාරි විසින් සකස් කල යුතු වේ.

### 3.2 වැඩසටහන ක්‍රියාත්මක කිරීම.

3.2.1 එක් ප්‍රතිලාභියකු වෙනුවෙන් ව්‍යාපෘතියෙහි වටිනාකමින් 75% ක මූල්‍ය දායකත්වයක්, රු. 100,000.00 ක උපරිමයකට යටත්ව මෙම වැඩසටහන යටතේ ලබා දිය හැක.

3.2.2 තෝරාගත් ප්‍රතිලාභීන්ගේ පුහුණු අවශ්‍යතා කණ්ඩායම් වශයෙන් ලබා දීම, මධ්‍යස්ථාන භාර විද්‍යා හා තාක්ෂණ නිලධාරීන්, දිස්ත්‍රික් විද්‍යා නිලධාරීන් විසින් සංවිධානය කල යුතු අතර එම වියදම් දිස්ත්‍රික්කය තුල ලබා දෙන ප්‍රතිපාදන සීමාව තුල ආවරණය කල යුතු වේ.

3.2.3 ඉහත 3.2.2 හි සඳහන් වියදම් අවම කර ගැනීම සඳහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුල සිටින විවිධ ආයතනයනවල සම්පත් දායකයන්ගෙන් ඉටු කර ගැනීම සඳහා ප්‍රමුඛතාවයක් ලබා දිය යුතු අතර, එසේ නොහැකි වන අවස්ථාවලදී පමණක් බාහිර සම්පත් දායකයන් යොදා ගත යුතු වේ. එම වැඩසටහන් දිස්ත්‍රික් විද්‍යා නිලධාරීන් විසින් සම්බන්ධීකරණය කල යුතුය. පුහුණු වැඩසටහන් පිළිබඳ විස්තර අධ්‍යක්ෂ (විද්‍යා) වෙත ලබා දිය යුතුය.

3.2.4 සියළුම ප්‍රසම්පාදනයන් රජයේ ප්‍රසම්පාදන මර්ගොපදේශයන්ට අනුකූල විය යුතු අතර, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ප්‍රසම්පාදන කමිටු තීරණ අනුව මිලදී ගැනීම් සිදුකල යුතුය.

3.2.5 යන්ත්‍ර හා උපකරණ ලබා ගැනීමේදී දේශීය නිෂ්පාදකයන්ගෙන් ලබා ගැනීම සඳහා විශේෂ ප්‍රමුඛතාවයක් ලබා දිය යුතුය.

3.2.6. මෙම වැඩසටහන දිස්ත්‍රික් ලේකම්ගේ අධීක්ෂණය යටතේ, ප්‍රාදේශීය ලේකම්ගේ මෙහෙයවීමෙන් දිස්ත්‍රික් විද්‍යා නිලධාරීන්ගේ සම්බන්ධීකරණයෙන්, මධ්‍යස්ථාන භාර විද්‍යා හා තාක්ෂණ නිලධාරීන් විසින් ප්‍රාදේශීය මට්ටමේ අනෙකුත් රාජ්‍ය හා පෞද්ගලික ආයතනවල සහයෝගීත්වයෙන් සිදුකල යුතුය.

3.2.7 අනුමත කරන ලද ප්‍රතිලාභීන්ගේ නාම ලේඛනයක් ඇමුණුම - 04 අනුව දිස්ත්‍රික් ලේකම්ට ද පිටපත් සහිතව දිස්ත්‍රික් විද්‍යා නිලධාරි විසින් අධ්‍යක්ෂ (විද්‍යා) වෙත ලබා දිය යුතුය.

3.2.8 රජය හා ප්‍රතිලාභියා දරන ව්‍යාපෘති පිරිවැය ඉක්මවන මූල්‍ය අවශ්‍යතාවයන් මධ්‍යස්ථාන භාර විද්‍යා හා තාක්ෂණ නිලධාරි හා ක්ෂේත්‍ර සම්බන්ධීකාරක විසින් රාජ්‍ය මූල්‍ය ආයතන සම්බන්ධ කරගනිමින් සපුරා දිය යුතුය.

## 04. පරිපාලන වියදම් සඳහා ප්‍රතිපාදන

ව්‍යාපෘතියේ පරිපාලන වියදම් ආවරණය කිරීම සඳහා සමස්ත පිරිවැය ඇස්තමේන්තුවෙන් 0.75% නොඉක්මවන මුදලක් ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහාද, 0.25% නොඉක්මවන මුදලක් දිස්ත්‍රික් ලේකම් කාර්යාල සඳහාද, 1% නොඉක්මවන මුදලක් විද්‍යා සම්පත් මධ්‍යස්ථාන සඳහාද, 1% නොඉක්මවන මුදලක් අමාත්‍යාංශය සඳහාද වෙන්කරනු ලැබේ. විද්‍යා සම්පත් මධ්‍යස්ථාන සඳහා ප්‍රතිපාදන ලබාදීම අවශ්‍යතාවය අනුව විද්‍යා අංශය මගින් සිදු කරනු ඇත. මෙම ප්‍රතිපාදන ඉන්ධන, අතිකාල ගෙවීම්, වෙනත් දීමනා, ලිපි ද්‍රව්‍ය ආදිය සඳහා යොදා ගත හැකිය. කෙසේ වෙතත් පරිපාලන වියදම් අවසාන ව්‍යාපෘති පිරිවැයට ඇතුලත් කල යුතුය.

## 05. ප්‍රගතිය අධීක්ෂණය

5.1 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමේ ප්‍රගති විමර්ශනය ප්‍රාදේශීය ලේකම්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්විය යුතු අතර, දිස්ත්‍රික් මට්ටමේ ප්‍රගති විමර්ශණය දිස්ත්‍රික් ලේකම්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්විය යුතුය.

5.2 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමේ හා දිස්ත්‍රික් මට්ටමේ ප්‍රගතිය දිස්ත්‍රික් විද්‍යා නිලධාරීන් හා මධ්‍යස්ථාන භාර විද්‍යා හා තාක්ෂණ නිලධාරීන් අදාල ආකෘතිය අනුව අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කල යුතුය

5.3 අමාත්‍යාංශය විසින් මාසික ප්‍රගතිය සමාලෝචනය කරනු ලබන අතර ජාතික වශයෙන් මතුවන ගැටළු සඳහා විසඳුම් ලබා දෙනු ඇත.

5.4 ව්‍යාපෘතියෙන් අපේක්ෂිත ප්‍රතිඵල හා නිමැවුම ලැබෙන බවට, අමාත්‍යාංශය, දිස්ත්‍රික් ලේකම්, ප්‍රාදේශීය ලේකම්, දිස්ත්‍රික් විද්‍යා නිලධාරී, මධ්‍යස්ථාන භාර විද්‍යා හා තාක්ෂණ නිලධාරී හා ක්ෂේත්‍ර සම්බන්ධීකාරක සහතික විය යුතුය.

## 06. වැඩසටහන ඇගයීම

6.1 ආරම්භයේදී වැඩසටහන් අවසන් ඇගයීමට පාදක කරගැනීම සඳහා සෑම ව්‍යවසායකුගේම මූලික දත්ත රැස්කර පවත්වාගෙන යාම දිස්ත්‍රික් විද්‍යා නිලධාරී, මධ්‍යස්ථාන භාර විද්‍යා හා තාක්ෂණ නිලධාරී හා පරිගණක දත්ත ක්‍රියාකාරකරු විසින් කළ යුතුය.

6.2 දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා විද්‍යා අංශයේ සහයෝගයෙන් අමාත්‍යංශයේ පිහිටුවා ඇති ඇගයීම් ඒකකය මගින් වැඩසටහනේ ඇගයීම සිදුකරනු ලැබේ.

## 07. මූල්‍ය කළමනාකරණය

7.1 ප්‍රාදේශීය ලේකම් විසින් අනුමැතිය ලබාදෙන ප්‍රතිලාභීන් වෙනුවෙන් ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම් මගින් අදල ප්‍රාදේශීය ලේකම් වෙත ලබා දෙනු ඇත.

7.2 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය මත පදනම්ව දිස්ත්‍රික් ලේකම්වරුන්ට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙතින් අක්මුදල් සඳහා ඉල්ලීම් ඉදිරිපත් කල හැකිය.

7.3 ප්‍රතිපාදන නිදහස් කිරීමට සහ අදල ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත ලබා දීමට අමාත්‍යංශයේගිණුම් අංශය විසින් පහසුකම් සැපයිය යුතුය.

7.4 දිස්ත්‍රික් ලේකම්වරු, ප්‍රාදේශීය ලේකම්වරු, දිස්ත්‍රික් විද්‍යා නිලධාරීන්, මධ්‍යස්ථාන භාර විද්‍යා හා තාක්ෂණ නිලධාරීන් හා ක්ෂේත්‍ර සම්බන්ධීකාරකවරු මෙම වැඩසටහනට අදාල සියළුම ගෙවීම් 2021.11.30 දිනට පෙර පියවීමට සිදුවන බවට වග බලා ගත යුතුය.

## 08. ව්‍යාපෘතියේ ක්‍රියාත්මක කාල රාමුව

| | | | |
|---|---|---|---|
| 8.1 | ව්‍යාපෘතියට අදාල චක්‍රලේඛ හා උපදෙස් ලබා දීම | - | පෙබරවාරි 28 වන දිනට පෙර අවසන් කිරීම |
| 8.2 | ග්‍රාමීය කමිටුව මගින් ප්‍රතිලාභීන් තෝරාගැනීම | - | මාර්තු 20 වන දිනට පෙර අවසන් කිරීම |
| 8.3 | ප්‍රාදේශීය ලේකම් / ප්‍රාදේශීය සංවර්ධන කමිටු අනුමැතිය | - | අප්‍රේල් 10 වන දිනට පෙර අවසන් කිරීම |
| 8.4 | භෞතික ප්‍රගතිය සම්පූර්ණ කිරීම | - | ඔක්තෝබර් 31 දිනටපෙරඅවසන් කිරීම |
| 8.5 | සියළු ගෙවීම් අවසන් කිරීම | - | නොවැම්බර් 30දිනටපෙරඅවසන් කිරීම |

## 09. ව්‍යාපෘති සම්පූර්ණ කිරීමේ වාර්තාව

සම්පූර්ණ කරන ලද ව්‍යාපෘතිය පිළිබඳව වාර්තාවක් ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය සහිතව මධ්‍යස්ථාන භාර විද්‍යා හා තාක්ෂණ නිලධාරී විසින් දිස්ත්‍රික් විද්‍යා නිලධාරී මගින් 2022.01.31 දිනට පෙර විද්‍යා අංශයේ අධ්‍යක්ෂ වෙත දිස්ත්‍රික් ලේකම්ටද පිටපත් සහිතව ඉදිරිපත් කල යුතුය.

## 10. පැහැදිලි කරගැනීම.

මෙම චක්‍රලේඛය පිලිබඳ කිසියම් පැහැදිලි කරගැනීමක් අවශ්‍ය වන්නේ නම්, අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ (විද්‍යා), ඒ.එම්.ආරිෆ් මහතා, දූරකථන අංක 011 – 2331381 ඔස්සේ විමසන ලෙස කාරුණිකව දන්වමි.

**එම්.ඒ.බී.වී. බණ්ඩාරනායක,**
ලේකම්,
වේවැල්, පිත්තල, මැටි, ලී බඩු සහ ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය.

පිටපත් :-
1) ජනාධිපති ලේකම්
2) අග්‍රාමාත්‍ය ලේකම්
3) ලේකම්, මුදල් අමාත්‍යාංශය
4) ලේකම්, කර්මාන්ත අමාත්‍යාංශය
5) ලේකම්, තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය
6) සියලුම පළාත් සභා ප්‍රධාන ලේකම්වරු
7) සියළුම ප්‍රාදේශීය සංවර්ධන කමිටු සභාපතිවරුන්
8) ලේකම්, අභ්‍යන්තර ආරක්ෂක, ස්වදේශ කටයුතු හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය
9) ලේකම්, ආර්ථික පුනර්ජීවනය හා දරිද්‍රතාව තුරන් කිරීම සඳහා වන ජනාධිපති කාර්ය සාධක බලකාය
10) විගණකාධිපති, විගණකාධිපති දෙපාර්තුමේන්තුව
11) අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අයවැය දෙපාර්තුමේන්තුව
12) අධ්‍යක්ෂ ජනරාල්, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව
13) අධ්‍යක්ෂ ජනරාල්, ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව
14) අධ්‍යක්ෂ ජනරාල්, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
15) අධ්‍යක්ෂ, කුඩා ව්‍යවසාය සංවර්ධන අංශය, තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය
16) සභාපති, ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය

ඇමුණුම - 01

## වාවසායකයින් තෝරාගැනීමේ අයදුම්පත්‍රය

### එක් ග්‍රාම නිලධාරී වසමකට එක් ග්‍රාමීය කර්මාන්ත ව්‍යවසායකයෙක් බිහිකිරීමේ වැඩසටහන

### වේවැල්, පිත්තල, මැටි, ලී බඩු සහ ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

දිස්ත්‍රික්කය : ..............................................

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය : ..............................................

ග්‍රාම නිලධාරී වසම : ..............................................

ගම : ..............................................

1. අයදුම්කරුගේ නම : ..............................................................................................................................

2. ස්ථිර ලිපිනය : ..............................................................................................................................

3. දුරකථන අංකය : ..............................................................................................................................

4. ස්ත්‍රී පුරුෂභාවය : ..............................................................................................................................

5. ජාතික හැඳුනුම්පත් අංකය : ..............................................................................................................................

6. උපන් දිනය : ..............................................................................................................................

7. දළ මාසික අදායම : ..............................................................................................................................

8. ආරම්භ කිරීමට අපේක්ෂිත කර්මාන්තයේ ස්වභාවය :

   ..............................................................................................................................................................

9. ප්‍රාදේශීයව ලබා ගත හැකි අමුද්‍රව්‍ය :

   ..............................................................................................................................................................

10. වෘත්තීය සුදුසුකම් /විශේෂ නිපුණතා :

   ..............................................................................................................................................................

11. කර්මාන්තය සඳහා අපේක්ෂා කරන සහයෝගය :

.............................................................................................................................

12. ව්‍යාපෘතිය සඳහා ස්වයං දායකත්වය :

.............................................................................................................................

.................................................. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ........................................................ ග්‍රාම නිලධාරී වසමේ පදිංචි මා විසින් ඉහත දක්වා ඇති වැඩසටහන මගින් ප්‍රතිලාභියකු වශයෙන් තෝරාගැනීම සඳහා අයදුම් කරමි. එම ව්‍යාපෘතියේ සියලු කොන්දේසි පිළිපැදීමටත්, ලබාදෙන ප්‍රතිලාභය සම්පූර්ණයෙන්ම යෝජිත ක්‍රියාකාරකම් සඳහා භාවිතා කිරීමටත් සහතික වෙමි. ව්‍යාපෘතියේ කොන්දේසි පැහැර හරිනු ලැබුවහොත් ව්‍යාපෘතිය යටතේ සිදු කර ඇති වියදම් නැවත ගෙවීමට සිදු වන බව දනිමි.

දිනය :- ....................................

...........................................
අයදුම්කරුගේ අත්සන

ග්‍රාමීය කමිටුව දැනුවත් කරන ලදි.

ඉහත විස්තර සත්‍ය සහ නිවැරදිය.

.....................................................
ග්‍රාම නිලධාරී /ආර්ථික සංවර්ධන නිලධාරී /සමෘද්ධි සංවර්ධන නිලධාරී
(එක් නිලධාරියකු සහතික කිරීම ප්‍රමාණවත් වේ.)

**සම්මුඛ පරීක්ෂණ මණ්ඩල සාමාජිකයින්**
නිර්දේශ කරමි /නොකරමි

1. ....................................... 2. ....................................... 3. .......................................

ඉහත නිර්දේශය ප්‍රාදේශීය සංවර්ධන කමිටුවට ඉදිරිපත් කරන ලදී.

තෝරා ගැනීම අනුමතකරමි /නොකරමි

.......................................
ප්‍රාදේශීය ලේකම්ගේ අත්සන සහ නිල මුද්‍රාව

ඇමුණුම - 02

<u>ප්‍රතිලාභීන් තෝරාගැනීමේ නිර්ණායක</u>

- අඩු ආදායම්ලාභීන් සඳහා ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ.
- ග්‍රාමීය කර්මාන්තයක් ආරම්භ කිරීමට කැමැත්තක් දක්වන හා ඊට අදාළ වෘත්තිය සුදුසුකම් හෝ නිපුණතාවක් සහිත අය සඳහා විශේෂ අවධානයක් යොමු කළ යුතුවේ.
- කාන්තා ව්‍යවසායකයන් සඳහා ප්‍රමුඛත්වය ලබා දෙනු ලැබේ.
- ව්‍යවසායකයන් ආරම්භකිරීමට අපේක්ෂා කරනු ලබන කර්මාන්තය සඳහා අමුද්‍රව්‍ය හෝ වෙනත් පහසුකම් ලබාගැනීමේදී ඒ සඳහා ප්‍රාදේශීයව ඉහළ විභවතාවයක් පැවතීම.
- ව්‍යවසායකයන්ගේ ග්‍රාමීය කර්මාන්ත නිෂ්පාදන සඳහා ඉහළ අලෙවිකරණ අවස්ථාවක් පැවතීම, එම නිෂ්පාදනය අපනයන භාණ්ඩයක් සඳහා ආදේශකයක් වීම හෝ අපනයන හැකියාවක් සහිත වීම.
- අගය එකතු කළ නිෂ්පාදනයක් වීම, අපතේ යන අස්වැන්න ප්‍රයෝජනයට ගැනීම හෝ දේශීය අමුද්‍රව්‍ය බහුල වශයෙන් යොදා ගැනීම විශේෂයෙන් සැලකිල්ලට ගනු ලැබේ.
- ව්‍යවසායකයන් වැන්දඹු හෝ ආබාධිත අයකු වීම සුදුසුකම් ලැබීමේදී විශේෂ අවධානයට ලක් විය යුතු කරුණක් වේ.
- තාක්ෂණික දැනුම, ව්‍යවසායකත්ව හැකියාව හෝ මූල්‍ය අඩුපාඩු නිසා මින් පෙර අසාර්ථක වූ ග්‍රාමීය කර්මාන්තකරුවෙකු නැවත අලුතින් ග්‍රාමීය කර්මාන්තයක් ඇරඹීමට උනන්දු වේ නම් එවැනි පුද්ගලයන් සඳහා ද අවස්ථාවක් ලබාදීම සඳහා සැලකිලිමත් වීම.
- විෂයානුබද්ධ විශ්වවිද්‍යාල අධ්‍යාපනයක් ලබා ඇති විද්‍යාර්ථයන් සඳහා ප්‍රමුඛත්වය ලබාදීම.
- පාසැල් හැර ගිය තරුණ අයදුම්කරුවන් සඳහා ප්‍රමුඛත්වය ලබාදීම.
- නිෂ්පාදන ව්‍යවසායකත්වය ආරම්භ කිරීම සඳහා ප්‍රමුඛත්වය ලබා දිය යුතු අතර, සේවා සැපයීමේ අංශ සඳහා අවස්ථාව ලබා දිය නොහැක.

ඇමුණුම - 03

# <u>ව්‍යාපෘති යෝජනා ආකෘතිපත්‍රය</u>

1. ප්‍රතිලාභියා පිළිබඳ තොරතුරු

   i. නම : ..............................................................

   ii. ලිපිනය : ..............................................................

   iii. ග්‍රාම නිලධාරී වසම : ..............................................................

   iv. දුරකථන අංකය : ..............................................................

2. ව්‍යාපෘතියේ පසුබිම

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

3. ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

4. ව්‍යාපෘතියේ විශේෂිත අරමුණු

   I. ..............................................................................................................................

   ..............................................................................................................................

   II. ..............................................................................................................................

   ..............................................................................................................................

   III. ..............................................................................................................................

   ..............................................................................................................................

5. අපේක්ෂිත ප්‍රධාන ඉලක්කය

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

6. ව්‍යාපෘතිය ආරම්භ කරන ප්‍රදේශය (ග්‍රාම නිලධාරී වසම) : ..........................................................

7. ව්‍යාපෘතියේ ප්‍රාග්ධන පිරිවැය : ....................................................................................................

8. කාරක ප්‍රාග්ධනය පිළිබඳ විස්තර : ....................................................................................................

9. ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය වන අමතර ප්‍රාග්ධනය ප්‍රතිලාභියා විසින් සපයා ගන්නේද ? ඔව් / නැත

10. රජය හා ප්‍රතිලාභියා දරන ව්‍යාපෘති පිරිවැය ඉක්මවන අවස්ථාවකදී මූල්‍ය පහසුකම් අවශ්‍ය වන්නේ නම් ඒ පිළිබඳ විස්තර :

....................................................................................................................................................

....................................................................................................................................................

....................................................................................................................................................

....................................................................................................................................................

11. හඳුනාගත් ප්‍රතිලාභියා ව්‍යවසායකයෙක් බවට පත්කිරීමට අමාත්‍යංශයෙන් අවශ්‍ය වන දායකත්වය (උදා : තාක්ෂණික හා අනෙකුත් පුහුණු අවශ්‍යතා, යන්ත්‍රෝපකරණ අවශ්‍යතා, නිෂ්පාදනවල ගුණාත්මකතත්වය ඉහල නැංවීම සඳහා තත්ත්ව පරීක්ෂණ වාර්තා / ප්‍රමිති සහතික, මූල්‍ය ආයතන සම්බන්ධීකරණය, අලෙවිකරණය, ව්‍යවසායකත්ව හැකියාව වැඩිදියුණු කිරීම)

....................................................................................................................................................

....................................................................................................................................................

....................................................................................................................................................

....................................................................................................................................................

12. ව්‍යාපෘතියේ වියදම් ඇස්තමේන්තුව (ප්‍රතිලාභී දායකත්වය සහ අමාත්‍යාංශ දායකත්වය පැහැදිලිව දැක්විය යුතුය.)

....................................................................................................................................................

....................................................................................................................................................

නිර්දේශ කරමි

........................................
විද්‍යා හා තාක්ෂණ නිලධාරී

අනුමත කරමි / නොකරමි

........................................
ප්‍රාදේශීය ලේකම්

ඇමුණුම - 04

# අනුමත ප්‍රතිලාභී නාම ලේඛනය

දිස්ත්‍රික්කය : ........................................

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය : ........................................

| අනු අංකය | ග්‍රාම නිලධාරී වසම | අයදුම්කරුගේ මුලකුරු සමග නම | ස්ථිර ලිපිනය | ස්ත්‍රී පුරුෂ භාවය | ජාතික හැඳුනුම්පත් අංකය | දුරකථන අංකය | කර්මාන්තය | රජයේ දායකත්වය (රු.) | ප්‍රතිලාභී දායකත්වය (රු.) |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |

11